© සියලු ම හිමිකම් ඇවිරිණි

අනු අංකය: ………………

# ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරින්ගේ සංගමය

## ශිල්පීය අදියර
## න්‍යාමක ප්‍රශ්න පත්‍රය

පිටු ගණන : 09
ප්‍රශ්න ගණන : 09

<u>අයදුම්කරුවන්ට උපදෙස්:</u>

1. නියමිත කාලය පැය 3 කි.
2. I කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, II කොටසේ A කාණ්ඩයෙන් ප්‍රශ්න දෙකකට ද, B කාණ්ඩයෙන් ප්‍රශ්න දෙකකට ද පිළිතුරු සපයන්න.
3. පිළිතුරු එක් භාෂාවකින් (සිංහල) පමණක් ලියන්න.

| විෂය | විෂය සංකේතය |
|---|---|
| ආර්ථික විද්‍යාව හා ජාත්‍යන්තර ව්‍යාපාර | (ECN) 505 |

**I කොටස**

**<u>ප්‍රශ්න අංක 01</u>** *(ලකුණු 20)*

(1) පහත සඳහන් දෑ අතුරින් නිෂ්පාදන සාධකයක් හැටියට සැලකෙන ප්‍රාග්ධනයට උදාහරණයක් වශයෙන් සැලකෙන්නේ,

(a) ට්‍රක් රථයක්
(b) ට්‍රක් රථ රියදුරා
(c) ට්‍රක් රථ රියදුරාගේ ඉතිරිකිරීම්
(d) ට්‍රක් රථ රියදුරාගේ වැටුප

(2) පහත සඳහන් ක්‍රියාවන් අතුරින් රටක් සැලසුම් අර්ථ ක්‍රමයක් බවට සාක්ෂි දරන්නේ,

(a) පොලී අනුපාතය වෙනස් කිරීමට මහ බැංකුව සැලසුම් කිරීම
(b) සියලු සම්පත් බෙදා වෙන්කිරීම රජය විසින් සැලසුම් කිරීම
(c) ප්‍රාදේශීය අධිකාරයක් විසින් නව පුස්තකාලයක් සැලසුම් කිරීම
(d) මූල්‍ය අමාත්‍යාංශය වාර්ෂික අයවැය සැලසුම් කිරීම

(3) ලාභ ශ්‍රමය තම වාසියට හරවා ගැනීම සඳහා ඇමෙරිකා එක්සත් ජනපදයේ ඇතැම් ව්‍යාපාරයකට නිෂ්පාදන කටයුතු දියුණු වෙමින් පවතින රටවල ආරම්භ කරයි. කුමක් මෙම උපනතියට අනුබල දෙනු ලබන්නේ ද?

(a) බහු ජාතික සමාගම් පරිපාලනය කිරීමේ බාධක
(b) නිමි නිෂ්පාදිත සඳහා දැරීමට සිදුවන අධික ප්‍රවාහන පිරිවැය
(c) ශ්‍රමයේ රැකියා මත අචල්‍යතාවය
(d) නිදහස් වෙළෙඳාම පැවතීම

(4) ගොවියෙක් වඩාත් සාරවත් කුඹුරක් මිල දී ගත්තේ ය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඔහුට කම්කරුවන් ටික දෙනෙකුගෙන් හා අඩු උපකරණ ප්‍රමාණයකින් කලින් ලැබූ නිමැවුම් ප්‍රමාණයම ලබාගත හැකි විය. මෙම ආදේශනයෙන් දැක්වෙන්නේ,

(a) ප්‍රාග්ධනය වෙනුවට ශ්‍රමය හා භූමිය යොදා ගැනීම
(b) ශ්‍රමය වෙනුවට ප්‍රාග්ධනය හා භූමිය යොදා ගැනීම
(c) භූමිය වෙනුවට ප්‍රාග්ධනය හා ව්‍යවසාය යොදා ගැනීම
(d) භූමිය වෙනුවට ප්‍රාග්ධනය හා ශ්‍රමය යොදා ගැනීම

(5) නියඟය ආර්ථික ගැටලුවක් හැටියට මනාව විස්තර කෙරෙන්නේ කුමන වාක්‍යයෙන් ද?

(a) නියඟය පාලනය කළ නොහැක.
(b) වර්ෂාපතනය විශ්වාස කළ නොහැකි ය.
(c) නියඟයේ බලපෑම් රජය සම්බන්ධ කර ගනී.
(d) ජලය හිඟ භාණ්ඩයකි.

(6) ප්‍රතික්‍රමික බද්දක් යනුවෙන් විස්තර කෙරෙන්නේ,

(a) ඉහළ ආදායම් උපයන අය ඉහළ අනුපාතයකින් බදු ගෙවීම
(b) පහළ ආදායම් උපයන අය ඉහළ අනුපාතයකින් බදු ගෙවීම
(c) ඉහළ ආදායමකින් ඉහළ අනුපාතයක් ගැනීම
(d) පහළ ආදායමකින් ඉහළ අනුපාතයක් ගැනීම

(7) ඒකාධිකාරය පාලනය කිරීම සඳහා අඩංගු වන්නේ කුමන රාජ්‍ය ප්‍රතිපත්තිය ද?

(a) තරඟකාරී ප්‍රතිපත්තිය
(b) රැකියා ප්‍රතිපත්තිය
(c) මූල්‍ය ප්‍රතිපත්තිය
(d) මුදල් ප්‍රතිපත්තිය

(8) එක්සත් රාජධානියේ වැටුප් වැඩි කිරීමේ වඩාත්ම අදාළ ප්‍රතිඵලය වන්නේ,

(a) එක්සත් රාජධානියේ සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය අඩු වීම
(b) එක්සත් රාජධානියේ එක්සත් රාජධානියට අයත් කර්මාන්තවල නිමැවුම වැඩි වීම
(c) එක්සත් රාජධානියේ ඵලදායීතාවය වැඩි වීම
(d) එක්සත් රාජධානියේ කර්මාන්තවල ජාත්‍යන්තර තරඟකාරීත්වය අඩු වීම

(9) ව්‍යාපාරයක පිරිවැය පහත වගුවෙන් දැක්වේ.

| නිමැවුම | විචල්‍ය පිරිවැය ($) | මුළු පිරිවැය ($) |
|---|---|---|
| 0 | 0 | 40 |
| 1 | 10 | 50 |
| 2 | 16 | 56 |

ඒකක 2 ක් නිපදවීමේ සාමාන්‍ය ස්ථාවර පිරිවැය කුමක් ද?

(a) $ 6
(b) $ 8
(c) $ 20
(d) $ 28

(10) රජයක් ඒකාධිකාර අධෛර්මත් කරන්නේ මන්ද?

(a) ඔවුන්ට පහළ සාමාන්‍ය පිරිවැයක් ළඟා කරගත හැකි නිසා
(b) ඔවුන්ට විදේශීය ආයතන සමඟ තරඟ කළ හැකි නිසා
(c) ඔවුන්ට නව තාක්ෂණය හඳුන්වා දිය හැකි නිසා
(d) ඔවුන්ට අධිප්‍රමාණ ලාභ ලැබිය හැකි නිසා

(11) පහත සඳහන් දේ අතුරින් කුමක් රාජ්‍ය වියදම් වශයෙන් ඇතුලත් නොවන්නේ ද?

(a) සමාගම් විසින් වැය කළ ප්‍රාග්ධනය
(b) රාජ්‍ය ණයගැනීම් සඳහා ගෙවූ පොලී
(c) මධ්‍යම ආණ්ඩුව විසින් ආරක්ෂාව සඳහා කළ ආයෝජන
(d) පළාත් අධිකාරීන් විසින් බස්රථ සමාගම් සඳහා දෙන ලද සහනාධාර

(12) අයවැය අතිරික්තයක් ඇති වන්නේ,

(a) රාජ්‍ය වියදම රාජ්‍ය ආදායමට වඩා වැඩි වූ විට
(b) රාජ්‍ය ආදායම රාජ්‍ය වියදමට වඩා වැඩි වූ විට
(c) ආයාත නිර්යාතවලට වඩා වැඩි වූ විට
(d) නිර්යාත ආයාතවලට වඩා වැඩි වූ විට

(13) සේවා නියුක්ත මිනිසුන්ගේ ගණන වැඩි වීම කෙරෙහි බොහෝ දුරට බලපාන ප්‍රතිපත්තිය කුමක් ද?

(a) අවම වැටුපක් හඳුන්වාදීම
(b) විකුණුම් බද්දක් හඳුන්වාදීම
(c) ආදායම් බදු අඩු කිරීම
(d) ආයාත සඳහා තීරු ගාස්තු අඩු කිරීම

(14) 1992 දී රටවල ජනගහනය හා දළ ජාතික නිෂ්පාදිතය වගුවෙන් පෙන්නුම් කෙරේ.

| රට | දළ ජාතික නිෂ්පාදිතය | ජනගහනය |
|---|---|---|
| ඉතියෝපියාව | $ මිලියන 6,257 | මිලියන 55 |
| පෝලන්තය | $ මිලියන 83,823 | මිලියන 38 |
| නවසීලන්තය | $ මිලියන 41,304 | මිලියන 3.4 |

වගුවෙන් පෙන්වන්නේ කුමක් ද?

(a) නවසීලන්තයේ ඉහළම ජීවන තත්ත්වයක් පවතී.
(b) නවසීලන්තයට දෙගුණයකට වඩා ඉහළ ජීවන තත්ත්වයක් පෝලන්තයේ ඇත.
(c) ජීවන තත්ත්වය කෙරෙහි ජනගහනයේ බලපෑමක් නැත.
(d) ජීවන තත්ත්වය වැඩිවීම සඳහා රටක ජනගහනය වැඩි විය යුතුය.

(15) අලුත් පාරක් තැනීම සම්බන්ධයෙන් රජයක් තීරණය කළ යුතුව ඇත. පාර නිසා නගරයට වැඩකටයුතු ඇති වුවත් වනාන්තරයකින් කොටසක් විනාශ වේ. වැඩි වශයෙන්ම කවුරුන් මෙයට විරුද්ධ වීමට ඉඩ ඇත්ද?

(a) පාරිසරික සංරක්ෂණිකයින්
(b) මාර්ග තනන්නන්
(c) පාර ඉදිකිරීමට අවශ්‍ය ගල් සපයන්නන්
(d) නගරයේ රැකියා වියුක්තිකයින්

(16) ආසියාවෙන් හා අප්‍රිකාවෙන් කෙරෙන රෙදිපිළි හා ආහාර ආයාත වැඩි කිරීම සඳහා යුරෝපය විසින් වෙළෙඳ සම්බාධක අඩු කරන ලදී. මෙහි ප්‍රතිඵලය කුමක් ද?

(a) යුරෝපීය පාරිභෝගිකයින්ට වැඩි තේරීමක් ඇති වීම.
(b) යුරෝපීය නිෂ්පාදකයින්ට වැඩි ආදායමක් ලැබීම.
(c) යුරෝපීය රෙදිපිළි කර්මාන්තයේ සේවා වියුක්තිය අඩු වීම.
(d) අප්‍රිකාවේ ආර්ථික වෘද්ධිය වර්ධනය අඩු වීම.

(17) ඉල්ලුම අනම්‍ය වූ අවස්ථාවක දී රජය විසින් සහල් ආයාත කිරීමේ දී තීරු බද්දක් පැනවුවහොත් ඇති විය හැකි බලපෑම කුමක් ද?

(a) දේශීය වෙළෙඳපොලේ සහල් සැපයුම අඩු වීම
(b) සහල් ඉල්ලුම වැඩි වීම
(c) රාජ්‍ය ආදායම වැඩි වීම
(d) ආයාත සහල් සැපයුම වැඩි වීම

(18) පසුගිය මාසයේ තම ආදායම වියදම් කළ ආකාරය ශිෂ්‍යාවක් විසින් වාර්තාගත කළාය. මෙම අවස්ථාවේ මුදල් කුමන කාර්යයක් ඉටු කරනු ලැබුවේ ද?

(a) විනිමය මාධ්‍යයක්
(b) විලම්බිත ගෙවුම් ක්‍රමයක්
(c) වටිනාකම් සන්නිධියක්
(d) ගිණුම් ඒකකයක්

(19) ඉහළ වැටුප් ලබාගැනීමට වෘත්තීය සමිතියක් කරන ඉල්ලීම ප්‍රතිඵලදායක නොවන්නේ,

(a) පාරිභෝගික ඉල්ලුම වැඩිවීමේ දී
(b) ශ්‍රම ඵලදායීතාවය වැඩිවීමේ දී
(c) ලාභ වැඩිවීමේ දී
(d) සේවා වියුක්තිය වැඩිවීමේ දී

(20) ව්‍යාපාර සංවිධානවල දී ''අයිතිය හා පාලනය වෙනස් කිරීම'' යනුවෙන් අදහස් කරන්නේ,

(a) ශ්‍රම බලකායේ පාලනය වැඩි කිරීම
(b) ව්‍යාපාර සංවිධාන සඳහා රාජ්‍ය මැදිහත්වීම
(c) කොටස්කරුවන් නොවන අය කළමනාකරුවන් වශයෙන් පත් කිරීම
(d) පෞද්ගලික ව්‍යවසාය පුළුල් කිරීම

(21) බොහෝ රටවල බැංකු ක්‍රමය පාලනය කරන්නේ කුමන සංවිධානයෙන් ද?

(a) මහ බැංකුව
(b) වාණිජ බැංකුව
(c) ආයෝජන බැංකුව
(d) ලෝක බැංකුව

(22) බොහෝ රටවල් තම ආර්ථිකවල වෙළෙඳපොල බලවේග භූමිකාව පුළුල් කරයි. මෙම ක්‍රියාවෙන් කුමන ප්‍රතිඵලයක් බලාපොරොත්තු වන්නේ ද?

(a) ආර්ථික කාර්යක්ෂමතාවයේ වැඩිවීමක්
(b) ආදායම් සමානත්වයේ වැඩිවීමක්
(c) විශේෂ ප්‍රාගුණ්‍යයේ අඩුවීමක්
(d) වැඩි රාජ්‍ය පාලනයක්

(23) වෙළෙඳපොලක ටෙලිවිෂන් චිත්‍රපටි නරඹන්නන්ගේ මුල් සමතුලිතතාවය රූප සටහනේ X ලක්ෂ්‍යයෙන් දැක්වේ. ටෙලිවිෂන් චැනල් ගණන වැඩිවීම නිසා රැකියා අවස්ථා ගණන ද වැඩි විය. නව සමතුලිතතා ලක්ෂ්‍යය කුමක් ද?




(a) C
(b) A
(c) B
(d) D

(24) රූප සටහනෙන් දැක්වෙන්නේ ශ්‍රම සැපයුම හා ඉල්ලුමයි.




ශ්‍රම සැපයුම් වක්‍රය $S_1$ $S_1$ සිට $S_2$ $S_2$ දක්වා විතැන්වීමට බලපාන්නේ කුමක් ද?

(a) විශ්‍රාම යන වයස අඩු කිරීම
(b) පුහුණු කාල පරිච්ඡේද අඩු කිරීම
(c) සේවකයින් අතිරේක කාලයක් වැඩ කිරීමට කැමැත්ත අඩු වීම
(d) සේවකයින් වැඩ කරනවාට වඩා විවේකී වැඩ කටයුතුවලට කැමති වීම

(25) ව්‍යාපාරයක් වශයෙන් කේවල ස්වාමි ව්‍යාපාරවල ඇති ප්‍රධාන අවාසි මොනවා ද?

(a) අතිරේක ශ්‍රමය සේවා නියුක්ත කිරීමට නොහැකි වීම.
(b) මෙවැනි ව්‍යාපාරවලට බැංකු ණය දෙන්නේ නැත.
(c) නිමැවුම දේශීය වශයෙන් මිස විදේශීය වශයෙන් විකිණිය නොහැක.
(d) අයිතිකරු පෞද්ගලිකවම ණය සඳහා වගකිව යුතුය.

(26) ව්‍යාපාර ආයතනයක ඵලදායීත්වය කෙරෙහි වෘත්තීය සමිතියක කුමන ක්‍රියා හිංසාකාරී බලපෑම් බොහෝ දුරට ඇති කරනු ලැබේ ද?

(a) නව තාක්ෂණය පිළිගැනීම
(b) පාරිතෝෂික ක්‍රමයකට එකඟ වීම
(c) සේවක අතිරික්තයක් සැලසුම් සහගතව ඉවත් කිරීමේ දී විරෝධය පෑම
(d) ලාභ බෙදාගැනීමේ වැඩපිළිවෙලකට සම්බන්ධ වීම

(27) 1974 සහ 1984 සිම්බාබ්වේ රටේ නිෂ්පාදන ව්‍යුහය වගුවෙන් පෙන්නුම් කෙරේ.

| | දළ දේශීය නිෂ්පාදිතය % | |
|---|---|---|
| | 1974 | 1984 |
| කෘෂිකර්මය | 17.6 | 12.5 |
| පතල් හා කැනීම් | 7.6 | 5.7 |
| නිමැවුම් | 23.5 | 27.0 |
| අධ්‍යාපනය හා සෞඛ්‍ය | 4.9 | 9.6 |
| බෙදාහැරීම් හා වෙනත් සේවා | 46.4 | 45.2 |

මෙම සංඛ්‍යා ලේඛන කුමක් අනාවරණය කෙරේ ද?

(a) මුළු එකතුවේ කොටසක් හැටියට ප්‍රාථමික නිෂ්පාදනය අඩු වීම
(b) මුළු එකතුවේ කොටසක් හැටියට ද්විතීයික නිෂ්පාදනය අඩු වීම
(c) මුළු එකතුවේ කොටසක් හැටියට තෘතීයික නිෂ්පාදනය අඩු වීම
(d) මුළු නිමැවුමෙන් භාගයකට වඩා ප්‍රාථමික අංශය නිපදවීම

(28) වාණිජ බැංකුවක් හැර කුමන කාර්යයක් මහ බැංකුව විසින් ඉටුකරනු ලැබේ ද?

(a) එය මුදල් සැපයුම පාලනය කරයි.
(b) එය විදේශ විනිමය ගනුදෙනුවල යෙදේ.
(c) එය මූල්‍ය උපදේශ ලබා දෙයි.
(d) එය තැන්පත් පවත්වාගෙන යයි.

(29) ලන්දේසි හා එක්සත් රජාධානියේ තෙල් සමාගම් සතු උප සමාගම් රටවල් 84 ක ඇත. කැනීම්, සූක්ෂම විද්‍යුත්, රසායන ද්‍රව්‍ය හා තෙල් සම්බන්ධ ඔවුන්ගේ ක්‍රියාකාරකම් ලෝකයේ රටවල් ගණනාවක ව්‍යාප්තව ඇත.

ඉහත සඳහන් දෙයින් විස්තර වන්නේ කුමක් ද?

(a) ආපසු තිරස් වර්ධනය
(b) තිරස් වර්ධනය
(c) බහු ජාතික ව්‍යාපාර එකතුවක්
(d) රාජ්‍ය අංශයේ ව්‍යවසායක්

(30) වෘත්තීය සංගම් මගින් සෘජුවම ගනුදෙනු නොකරෙන්නේ කුමක් ද?

(a) ඵලදායීතා ගිවිසුම්
(b) කොටස්කරුවන්ගේ ලාභාංශ
(c) කම්කරු අතිරික්තතා
(d) වැඩ කිරීමේ කොන්දේසි

(31) රජය සතු කර්මාන්තයක් පෞද්ගලීකරණය කොට දහස් ගණන් විවිධ කොටස්කරුවන්ට විකුණනු ලැබුවහොත් එහි තත්ත්වය වෙනස් වන්නේ,

(a) සීමිත පෞද්ගලික සමාගමක සිට සීමිත පොදු සමාගමකට
(b) සීමිත පොදු සමාගමක සිට සීමිත පෞද්ගලික සමාගමකට
(c) රාජ්‍ය සංස්ථාවක සිට සීමිත පෞද්ගලික සමාගමකට
(d) රාජ්‍ය සංස්ථාවක සිට සීමිත පොදු සමාගමකට

(32) ස්ටර්ලින් පවුමක අගය ඇමෙරිකන් ඩොලර්වලින් (විනිමය අනුපාතය) පහත වගුවෙන් ප්‍රකාශ වේ.

| වර්ෂය | ඇමෙරිකන් ඩොලර් |
|---|---|
| 1994 | 1.54 |
| 1995 | 1.61 |
| 1996 | 1.64 |
| 1997 | 1.69 |

1994 සිට 1997 දක්වා පවුමක විනිමය අගය වෙනස් වීම සම්බන්ධයෙන් බොහෝ දුරට බලපෑ දේ කුමක් ද?

(a) එක්සත් ජනපද ගෙවුම් ශේෂයේ ජංගම ගිණුමේ ඇති වූ වැඩිදියුණුවක්
(b) ඇමෙරිකා එක්සත් ජනපදයෙන් එක්සත් රාජධානියට කළ ආයාත මිල වැඩි වීම
(c) බොහෝ බ්‍රිතාන්‍ය ජාතික සංචාරකයින් ඇමෙරිකා එක්සත් ජනපදයේ නිවාඩු ගත කිරීම
(d) එක්සත් රාජධානියේ නිර්යාත කර්මාන්තවල වැඩිපුර සේවා නියුක්තිය

(33) ජර්මනියේ දළ දේශීය නිෂ්පාදිතය වාර්ෂිකව මූර්ත වශයෙන් 2% ක් වැඩිවන විට 1999 දී ඇමෙරිකා එක්සත් ජනපදයේ දළ දේශීය නිෂ්පාදිතය මූර්ත වශයෙන් 4.5% කින් වාර්ෂිකව වැඩි විය.

මෙම වාක්‍යවලින් කුමන නිගමනයකට එළඹිය හැකි ද?

(a) ඇමෙරිකා එක්සත් ජනපදයේ හා ජර්මනිය යන දෙරටේම මිල වැඩි විය.
(b) උද්ධමනයට ඉඩ සලසමින් සංඛ්‍යා ගලපා ඇත.
(c) ජර්මනියට වඩා ඇමෙරිකා එක්සත් ජනපදයේ ජීවන මට්ටම ඉහළ ය.
(d) ජර්මනියේ සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ සේවා වියුක්තිය අඩු වී ඇත.

(34) උපත් අනුපාතය වැඩි වීම නිසා රටක ජනගහනය සීඝ්‍රයෙන් වැඩි වේ. බොහෝ දුරට ඇති විය හැකි ප්‍රතිඵලය වන්නේ,

(a) වයස්ගත ජනගහනය
(b) රටේ ඵලදායීතාවය වැඩි වීම
(c) යැපෙන්නන්ගේ ජනගහනය වැඩි වීම
(d) සේවා වියුක්තිය අඩු වීම

(35) රටක ජීවන තත්ත්වය කුමක් මගින් වඩා නිවැරදිව මැන බැලේ ද?

(a) ගෙවුම් ශේෂය
(b) විනිමය අනුපාතය
(c) ඒකපුද්ගල දළ දේශීයනිෂ්පාදිතය
(d) උද්ධමන අනුපාතය

(36) පාන් සඳහා ඉල්ලුම හා සැපයුම රූප සටහනින් දැක්වේ.




පාන් ගෙඩියක් සඳහා උපරිම මිල OP වශයෙන් රජය නියම කර ඇත.

මෙම ක්‍රියාවේ සිදුවිය හැකි ආසන්නතම ප්‍රතිඵලය කුමක් ද?

(a) ඉල්ලුම් වක්‍රය වටම විතැන් වීම
(b) සැපයුම් වක්‍රය දකුණට විතැන් වීම
(c) පාන් හිඟයක් ඇති වීම
(d) පාන් අතිරික්තයක් ඇති වීම

(37) බොහෝ රටවල කාර්යබහුල කාලඡේදවල දී තැපැල් සේවය සඳහා අතිරේක තැපැල් එකතු කිරීමට හා බෙදාහැරීමට අතිරේක කාර්ය මණ්ඩල යොදා ගනු ලැබේ.

මේ කාලපරිච්ඡේදවල දී තැපැල් සේවය සඳහා ඉල්ලුම් හා සැපයුම් වක්‍රවලට කුමක් සිදු වේද?

| | ඉල්ලුම් වක්‍රය | සැපයුම් වක්‍රය |
|---|---|---|
| (a) | වමට මාරු වේ. | වමට මාරු වේ. |
| (b) | වමට මාරු වේ. | නොවෙනස්ව පවතී. |
| (c) | දකුණට මාරු වේ. | දකුණට මාරු වේ. |
| (d) | නොවෙනස්ව පවතී. | දකුණට මාරු වේ. |

(38) භාණ්ඩයක මිල දෙගුණයක් වන විට ඉල්ලුම භාගයකට වඩා අඩුවන අතර විකුණුම්කරුගේ ආදායම අඩු වේ. මෙම භාණ්ඩය පිළිබඳව මෙයින් කුමක් අදහස් වන්නේ ද?

(a) එයට ආදේශක ඇත.
(b) එය අවශ්‍යම වේ.
(c) එය පූර්ණ නම්‍ය ඉල්ලුමකින් යුක්ත ය.
(d) එහි සැපයුම ස්ථාවරව පවතී.

(39) පහත දැක්වෙන දත්ත 1998 හා 1999 යන වර්ෂවල දී මැලේසියාවේ වෙළෙඳ කාර්යඵලය ඇමෙරිකන් ඩොලර් බිලියනවලින් දැක්වේ.

| | 1998 | 1999 |
|---|---|---|
| නිර්යාත භාණ්ඩ | 72.0 | 72.5 |
| ආයාත භාණ්ඩ | 57.0 | 60.5 |
| සේවා ශේෂය | - 4.3 | - 5.3 |
| ශුද්ධ පැවරුම් | - 1.5 | - 1.6 |

මේ වර්ෂ දෙකේ දී මැලේසියාවේ දෘශ්‍ය වෙළෙඳ ශේෂයට හා ජංගම ගිණුමේ ශේෂයට කුමක් සිදු වීද?

| | දෘශ්‍ය වෙළෙඳ ශේෂය | ජංගම ගිණුමේ ශේෂය |
|---|---|---|
| (a) | වැඩිදියුණු විය | වැඩිදියුණු විය |
| (b) | වැඩිදියුණු විය | නරක අතට හැරුණි |
| (c) | නරක අතට හැරුණි | වැඩි දියුණු විය |
| (d) | නරක අතට හැරුණි | නරක අතට හැරුණි |

(40) උපරිම ධාරිතාවයකින් යුතුව කර්මාන්තශාලාවක් ටෙනිස් පිති හා ගොල්ෆ් පිති නිපදවයි. ගොල්ෆ් පිති සඳහා ඇති වූ අධික ඉල්ලුම හේතුකොට ගෙන ටෙනිස් පිති අඩුවෙන් හා ගොල්ෆ් පිති වැඩියෙන් නිපදවීමට කළමනාකාරීත්වය තීරණය කරයි.

ගොල්ෆ් පිති වැඩියෙන් නිපදවීමේ ආවස්ථික පිරිවැය කුමක් ද?

(a) ගොල්ෆ් පිති සෑදීම සඳහා සමහර සේවකයින් නැවත පුහුණු කිරීමේ පිරිවැය
(b) නිෂ්පාදනය කරන ලද අතිරේක ගොල්ෆ් පිති ප්‍රවාහනය කිරීමේ හා විකිණීමේ පිරිවැය
(c) අතිරේක ගොල්ෆ් පිති නිෂ්පාදනයට මිල දී ගත් ද්‍රව්‍ය
(d) දැන් නිෂ්පාදනය නොකරන ටෙනිස් පිති

**(40 x ½ ලකුණු = 20 ලකුණු)**
I කොටස අවසානයි.

**II කොටස**

**A කාණ්ඩය**

**ඕනෑම ප්‍රශ්න 2 කට පිළිතුරු සපයන්න.**

**<u>ප්‍රශ්න අංක 01 *(ලකුණු 20)*</u>**

(a) ආර්ථික විද්‍යාවේ මූලික ගැටලු විස්තර කරන්න. (ලකුණු 06)

(b) හිඟකම හා තේරීම යනුවෙන් ඔබ කුමක් අදහස් කරන්නේ ද? (ලකුණු 06)

(c) නිදහස් වෙළෙඳපොල ක්‍රමය මේ ගැටලු විසඳන්නේ කෙසේ ද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 08)

(මුළු ලකුණු 20)

**<u>ප්‍රශ්න අංක 02 *(ලකුණු 20)*</u>**

(a) ඉල්ලුම් න්‍යාය යනු කුමක් ද? රූප සටහනක් හා ඉල්ලුම් ලේඛනයක් යොදාගෙන මෙය පැහැදිලි කරන්න. (ලකුණු 06)

(b) ඉල්ලුම් වක්‍රයක් දිගේ ගමන් කිරීම හා ඉල්ලුම් වක්‍රයක් විතැන්වීම යනුවෙන් ඔබ කුමක් අදහස් කරන්නේ ද? (ලකුණු 08)

(c) ඉල්ලුම සඳහා බලපාන අන් සාධක 3 ක් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(මුළු ලකුණු 20)

**<u>ප්‍රශ්න අංක 03 *(ලකුණු 20)*</u>**

(a) ඒකාධිකාරයේ ප්‍රධාන ලක්‍ෂණ විස්තර කරන්න. (ලකුණු 10)

(b) ඒකාධිකාරයක් ඇතිවීමට තුඩුදෙන ප්‍රධාන බාධක තුනක් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

(මුළු ලකුණු 20)

**<u>ප්‍රශ්න අංක 04 *(ලකුණු 20)*</u>**

(a) නිෂ්පාදන සාධක හතර නම් කරන්න. (ලකුණු 02)

(b) වැටුප් විවිධතා ඇතිවන්නේ කෙසේ ද? උදාහරණ දෙන්න. (ලකුණු 08)

(c) වෘත්තීය සංගම් ඉටු කරන වැදගත් කාර්යයන් මොනවා ද? (ලකුණු 10)

(මුළු ලකුණු 20)

A කාණ්ඩය අවසානයි.

**II කොටස**

**B කාණ්ඩය**

**ඕනෑම ප්‍රශ්න 2 කට පිළිතුරු සපයන්න.**

**<u>ප්‍රශ්න අංක 05</u>** *<u>(ලකුණු 20)</u>*

(a) බදු අනුපාතය යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 04)

(b) ප්‍රධාන බදු වර්ග දෙකක් උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 06)

(c) රාජ්‍ය ආදායම වියදම් කරන ආකාරය විස්තර කරන්න. (ලකුණු 10)

(මුළු ලකුණු 20)

**<u>ප්‍රශ්න අංක 06</u>** *<u>(ලකුණු 20)</u>*

(a) ජාතික ආදායම නිර්වචනය කරන්න. (ලකුණු 04)

(b) ජාතික ආදායම් දත්ත රැස්කිරීමේ ප්‍රධාන හේතු සාකච්ඡා කරන්න. (ලකුණු 10)

(c) ජාතික ආදායම ගණනය කිරීමේ දී මතුවන ප්‍රශ්න 3 ක් සඳහන් කරන්න. (ලකුණු 06)

(මුළු ලකුණු 20)

**<u>ප්‍රශ්න අංක 07</u>** *<u>(ලකුණු 20)</u>*

(a) සිල්ලර මිල දර්ශකය කුමක් මණිනු ලබයි ද? (ලකුණු 02)

(b) උද්ධමනයට බලපාන හේතු 3 ක් විස්තර කරන්න. (ලකුණු 10)

(c) රජයකට උද්ධමනය ප්‍රශ්නයක් වන්නේ කෙසේ ද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 08)

(මුළු ලකුණු 20)

**<u>ප්‍රශ්න අංක 08</u>** *<u>(ලකුණු 20)</u>*

(a) වෙළෙඳ සම්බාධක 3 වර්ගයක් විස්තර කරන්න. (ලකුණු 06)

(b) ශ්‍රී ලංකාව වැනි රටකට වෙළෙඳ සම්බාධක බලපාන්නේ කෙසේ ද? (ලකුණු 08)

(c) නිදහස් වෙළෙඳාමේ වාසි තුනක් සඳහන් කරන්න. (ලකුණු 06)

(මුළු ලකුණු 20)

B කාණ්ඩය අවසානයි.

II කොටස අවසානයි.

**ප්‍රශ්න පත්‍රය අවසානයි.**